

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2025



ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

පරිසර අමාත්‍යාංශය

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 294

පටුන

වගු ලැයිස්තුව IV

ප්‍රස්තාර ලැයිස්තුව V

රූප සටහන් ලැයිස්තුව V

01. පරිච්ඡේදය 1

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු 2

1.3 ප්‍රධාන කාර්යයන් 3

1.4 සංවිධාන සටහන 4

02.පරිච්ඡේදය 5

ප්‍රගතිය හා ඉදිරි දැක්ම 5

2.1 ජයග්‍රහණ 5

2.2 ප්‍රගතිය 5

2.2.1 2025.12.31 දිනට සංචාරක පැමිණීම සහ ආදායම 5

2.2.2 2025.12.31 වන දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය 8

2.2.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගති සාරාංශය 9

2.2.4 2025.12.31 වන දිනට සත්ත්ව එකතුව 9

2.2.5 සත්ත්ව හුවමාරු වැඩසටහන් හා සතුන් මිලදී ගැනීම 10

2.2.6 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආයතන සහ එහි කාර්යයන් 11

2.2.6.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය 11

2.2.6.2 පින්නවල අලි අනාථාගාරය 15

2.2.6.3 පින්නවල සත්වෝද්‍යානය 19

2.2.6.4 රිදියගම සෆාරි උද්‍යානය 23

2.2.7 දෙපාර්තමේන්තුවේ සත්ත්ව ආහාර නිෂ්පාදන ගොවිපල 26

2.2.8 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 27

2.2.8.1 රජයේ ඒකාබද්ධ අරමුදල 27

2.2.8.2 සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල 29

2.3 අභියෝග 31

2.4 ඉදිරි ඉලක්ක 31

03.පරිච්ඡේදය 32
වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය 32
3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - 2025 32
3.2 මූදල් ප්‍රවාහ ප්‍රකාශය 33
3.3 මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 34
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 35
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 35
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 36
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන. 36
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 36
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 36

04. පරිච්ඡේදය 37
කාර්ය සාධන දර්ශක 37
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 37

05. පරිච්ඡේදය 38
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 38
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 38
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහන හා අභියෝග 40

06 පරිච්ඡේදය 41
මානව සම්පත් පැතිකඩ 41
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 41
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම. 41
6.3 මානව සම්පත් සංවර්ධනය 41
6.4 ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන්හි දායකත්වය 44

07 පරිච්ඡේදය 45
7.1 අනුකූලතා වාර්තාව 45

වගු ලැයිස්තුව

වගු සටහන 2.1 2025 වසරේ සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)..... 5

වගු සටහන 2.2 දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරක පැමිණීම සහ ආදායම ..5

වගු සටහන 2.3 2024 - 2025 වර්ෂය දක්වා සංචාරකයන්ගේ පැමිණීම සහ ආදායම..... 6

වගු සටහන 2.4 2010 වසරේ සිට 2025 වසර දක්වා සංචාරක පැමිණීම සහ ආදායම 7

වගු සටහන 2.5 2025.12.31 දිනට ප්‍රතිපාදන හා වියදම් තොරතුරු සාරාංශය (ඒකාබද්ධ අරමුදල)..... 8

වගු සටහන 2.6 2025.12.31 දිනට වියදම් තොරතුරු සාරාංශය
(සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල) 8

වගු සටහන 2.7 2025.12.31 දිනට ඒකාබද්ධ අරමුදලේ සංවර්ධන කටයුතු වල මූල්‍ය ප්‍රගති සාරාංශය..... 9

වගු සටහන 2.8 2025.12.31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රගතිය 9

වගු සටහන 2.9 2025.12.31 දිනට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මුළු සත්ත්ව එකතුව..... 9

වගු සටහන 2.10 2025.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ගෙන්වන ලද සතුන්.... 10

වගු සටහන 2.11 2025.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන ලද සතුන් 10

වගු සටහන 2.12 2025.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව 11

වගු සටහන 2.13 2025.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව 11

වගු සටහන 2.14 2025 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්..... 12

වගු සටහන 2.15 2025.12.31 දිනට දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය.....13

වගු සටහන 2.16 2025.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව එකතුව 15

වගු සටහන 2.17 2025.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව..... 16

වගු සටහන 2.18 2025 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්.. 16

වගු සටහන 2.19 2025.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය.... 17

වගු සටහන 2.20 2025.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව..... 20

වගු සටහන 2.21 2025.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව..... 20

වගු සටහන 2.22 2025 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්..... 20

වගු සටහන 2.23 2025.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය..... 21

වගු සටහන 2.24 2025.12.31 දිනට රිදියගම සඟාරි උද්‍යානයේ සත්ත්ව එකතුව..... 23

වගු සටහන 2.25 2025.12.31 දිනට රිදියගම සඟාරි උද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව 23

වගු සටහන 2.26 2025 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන.....24

වගු සටහන 2.27 2025.12.31 දිනට රිදියගම සඟාරි උද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය 24

වගු සටහන 2.28 2025.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව එකතුව 26

වගු සටහන 2.29 2025.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව අභිජනන සංඛ්‍යාව..... 26

වගු සටහන 2.30 වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල 27

වගු සටහන 2.31 මුදල් පදනම මත සකස් කරන ලද වියදම් තොරතුරු 29

වගු සටහන 2.32 උපචිත පදනම මත සකස් කරන ලද ලාභ අලාභ ගිණුම - සත්වෝද්‍යාන සංවර්ධන
සහ සුබ සාධක අරමුදල..... 30

වගු සටහන 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 32
වගු සටහන 3.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 33
වගු සටහන 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 34
වගු සටහන 3.4 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 35
වගු සටහන 3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 36
වගු සටහන 3.6 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 36
වගු සටහන 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක 37
වගු සටහන 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 38
වගු සටහන 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 41
වගු සටහන 6.2 මානව සම්පත් සංවර්ධනය 41
වගු සටහන 7.1 අනුකූලතා වාර්තාව 45

ප්‍රස්තාර ලැයිස්තුව

ප්‍රස්තාර සටහන 1.1 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන 4
ප්‍රස්තාර සටහන 2.1 2025 වසරේ සංචාරකයින්ගේ පැමිණීම 6
ප්‍රස්තාර සටහන 2.2 2025 වසරේ දෙපාර්තමේන්තුවේ ආදායම 7
ප්‍රස්තාර සටහන 2.3 2010 - 2025 දක්වා සංචාරක පැමිණීම 7
ප්‍රස්තාර සටහන 2.4 2010 - 2025 දක්වා දෙපාර්තමේන්තුවේ ආදායම රු.මි. 8

රූප සටහන් ලැයිස්තුව

රූප සටහන 2.1 කහපොළ ගොවිබිම සංවර්ධනය හා වෙනත් 14
රූප සටහන 2.2 වානර දූපත - අදියර 1 14
රූප සටහන 2.3 මද කිපුණු අලින් සඳහා අරණක් ඉදිකිරීම (අදියර - 01). 18
රූප සටහන 2.4 මද කිපුණු අලින් සඳහා අරණක් ඉදිකිරීම (අදියර - 02). 18
රූප සටහන 2.5 කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහලේ ඉතිරි වැඩ කටයුතු - ඉතිරි වැඩ. 18
රූප සටහන 2.6 අභ්‍යන්තර මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම - ඉතිරි වැඩ. 18
රූප සටහන 2.7 බිළාල කුළයේ කුඩා සතුන් සඳහා අරණ 22
රූප සටහන 2.8 කුඩා පරිමාණ සංවර්ධනය 22
රූප සටහන 2.9 මායිම් චේන්ලින්ක් වැට සංවර්ධනය 22
රූප සටහන 2.10 පෝනියන් සඳහා අරණක් ඉදිකිරීම 22
රූප සටහන 2.11 රේසර් වයර් වැට - අදියර I 25
රූප සටහන 2.12 පශ්චාත් මරණ පරීක්ෂණ කාමරය 25

01. පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය



මේජර් ඕබ්රි එන්. වයිමන් මහතා දෙහිවල සත්ව උද්‍යානයේ සිටියදී ගන්නා ලද ඡායාරූපයකි

1.1 හැඳින්වීම

ජර්මන් ජාතික ජෝන් හාර්ගෙන්බර්ග් මහතා විසින් වර්ෂ 1905 දී පමණ වනගත සතුන් අල්ලා ජර්මනියේ පිහිටි හැම්බර්ග් නගරයට අපනයනය කිරීමට පෙර, රඳවා තබා ගන්නා ස්ථානයක් ලෙස අක්කර 5ක භූමි ප්‍රමාණයක දෙහිවල සත්වෝද්‍යානය ආරම්භ කර ඇත. පසුව, කාලයත් සමඟ සත්වගාලෙහි රඳවා සිටින අලි ඇතුන් හා වෙනත් සත්ත්ව විශේෂයන් නැරඹීමට පැමිණෙන අති විශාල ජනතාව හේතුවෙන් අක්කර 11 ක භූමි ප්‍රමාණයකට පුළුල් කර වර්ෂ 1926 දී මෙය "ලංකා සත්ත්ව උද්‍යාන සමාගම" (Ceylon Zoological Gardens Company) ලෙස නම් කර ඇත.

වර්ෂ 1933 දී ඇතිවූ දෙවන ලෝක මහා සංග්‍රාමයත් සමඟ එම සමාගම බ්‍රිතාන්‍ය යටතට පත් වී ඇති අතර, 1935 පමණ වනවිට සත්ත්ව උද්‍යාන සමාගමේ ජීවත් වූ වන සතුන් සීඝ්‍රයෙන් බෝවීමත්, ඔවුන්ට ප්‍රමාණවත් ඉඩකඩ හා ආහාරපාන නොමැති වීමත් මත ලංකා සත්වෝද්‍යාන සමාගම බංකොලොත්භාවයට පත් වී ඇත.

පසුව, වන සත්ත්ව ලෝලියෙකු වූ මේජර් ඕබ්රි එන්. වයිමන් මහතා විසින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව වෙත සිදුකළ දැඩි ඉල්ලීමක ප්‍රතිඵලයක් ලෙස, වර්ෂ 1936 ජූලි මස 03 වන දින ලංකා සත්ත්ව උද්‍යාන සමාගම රජයට පවරාගන්නා ලද අතර, උද්‍යානය අක්කර 23 ක භූමිභාගයක් දක්වා පුළුල් කර ඇත.

පසුව, 1962 වර්ෂයේ දී මෙය "ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව" ලෙස ප්‍රකාශයට පත් කරමින් ස්වාධීන දෙපාර්තමේන්තුවක් ලෙස මෙහි පාලන කටයුතු 1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධිවිධාන අනුව ස්ථාපිත කර ඇත.

වර්තමානය වනවිට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය සහ හම්බන්තොට සෆාරී උද්‍යානය යන ප්‍රධාන මෙහෙයුම් ඒකක 04 මඟින් සත්ත්වයින් විතැන් සංරක්ෂණය සිදු කරනු ලබයි. මීට අමතරව, සත්වෝද්‍යාන සඳහා අවශ්‍ය සත්ත්ව ආහාර නිෂ්පාදනය දෙපාර්තමේන්තුවට අයත්, ගෝනපොළ, කහපොළ සහ දියගම ගොවිපොළ මඟින් සිදු කෙරේ. මේ අනුව, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් කටයුතු දෙහිවල සත්වෝද්‍යාන පරිශ්‍රයේ දී සිදු කරනු ලබන අතර, සියලු උප ආයතන එක්ව දෙපාර්තමේන්තුවේ අරමුණු ළඟා කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

"ලෝකයේ විශිෂ්ටතම සත්වෝද්‍යාන පවත්වා ගෙන යනු ලබන ආයතනයක් බවට පත්වීම."

මෙහෙවර

"නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ, ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීණතාවයන් උපයෝගී කර ගනිමින්, පිළිගත් නීති රීතිවලට අනුකූලව උපරිම රැකවරණය යටතේ නිවහන සපයමින්, විවිධත්වයෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සත්ත්ව එකතුවක් ප්‍රදර්ශනය කිරීම."

අරමුණු

- ජෛව විවිධත්ව සංරක්ෂණය.
- සත්ත්ව සුභසාධනය.
- අධ්‍යාපන සහ විෂය මූලික දැනුම වර්ධනය.
- පර්යේෂණ සහ නවෝත්පාදන.
- තිරසාර පිළිවෙත් අනුගමනය.
- ප්‍රජා සහභාගීත්වය.
- නරඹන්නන්ගේ අත්දැකීම් ප්‍රවර්ධනය.
- ප්‍රමිතිකරණය සහ නවීකරණය.







දෙහිවල සත්ව උද්‍යානයේ දී 1960-1980 අතර කාලයේදී ලබා ගන්නා ලද ඡායාරූප

1.3 ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් කාර්යයන්හි නියැලෙමින් ආයතනික අරමුණු ළඟා කරගැනීමට කටයුතු කරනු ලබයි.


- ස්වාභාවික තත්ත්වයට ආසන්න වාසභූමියක් තුළ විවිධත්වයෙන් යුතු දේශීය හා විදේශීය සත්ත්ව එකතුවක් පවත්වාගෙන යාම.
- ජාත්‍යන්තර සබඳතා වර්ධනය කරගනිමින් සත්වෝද්‍යාන ජාලය තුළ ක්‍රියාකාරී ආයතනයක් බවට පත් වීම සහ නව තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා සත්ත්ව හුවමාරු වැඩසටහන්වලට සහභාගීවීම.
- දේශීය හා ගෝලීය වශයෙන් වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂ සහ ඔවුන්ගේ වාසස්ථාන සංරක්ෂණය කිරීම සඳහා ඵලදායී සංරක්ෂණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.
- අපගේ රැකවරණයේ සිටින සියලුම සතුන්ගේ ශාරීරික හා මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කරමින් ඔවුන් සඳහා ඉහළම ප්‍රමිතීන් සහ රැකවරණය සහතික කිරීම.
- වන සතුන් සහ ස්වභාවික ලෝකයෙහි වැදගත්කම පිළිබඳ අගය කිරීම, අවබෝධය සහ ගෞරවය වර්ධනය කිරීම සඳහා සියලුම වයස්වල නරඹන්නන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් සහ අත්දැකීම් ලබා දීම.
- ලොව පුරා සිටින ප්‍රමුඛ පෙළෙහි විශේෂඥයින් සහ ආයතන සමඟ සහයෝගීව නව විද්‍යාත්මක දැනුම සහ සංරක්ෂණ ප්‍රයත්නයන් පිළිබඳ වන නව පර්යේෂණ සඳහා මුලපිරීම.
- මිනිස් ක්‍රියාකාරකම් තුළින් පරිසරයට සිදු වන හානිය අවම කිරීම සඳහා කාර්යක්ෂම ලෙස සම්පත් කළමනාකරණය, පරිසරයට අපද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම, මූල්‍ය තිරසාරභාවය සහ ප්‍රශස්ථ බලශක්ති භාවිතය සහතික කිරීම සඳහා සියලු අංශ වල කටයුතු තිරසාර සහ නිර්මාණාත්මක ලෙස සිදු කිරීම.
- පාරිසරික සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කොට පාරිසරික දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම, ප්‍රජා මූලික කටයුතු සංවර්ධනය කිරීම සඳහා අදාළ ප්‍රජාවන් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- මනා ලෙස පහසුකම් නඩත්තු කිරීම, දැනුම හා අත්දැකීම් මූලික ප්‍රදර්ශන පහසුකම් සැළසීම සහ වනජීවීන් සමඟ මතකයේ රැඳෙන අන්තර්ක්‍රියා සඳහා අවස්ථාව සැළසීම තුළින් නරඹන්නන් හට ස්වභාවධර්මය සමඟ අනවතර බැඳීමක් ඇති කර ගැනීමේ අවස්ථාව සැළසීම සහ ඒ තුලින් විවිධ ආදායම් මාර්ග උත්පාදනය සහ මූල්‍ය තිරසාරභාවය ඇති කිරීම.
- ප්‍රමිතිගත ක්‍රියා පටිපාටි සහ නවීන තාක්ෂණයන් ස්ථාපිත කර මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ සත්ව රැකවරණය වැඩිදියුණු කිරීම තුළින් ගෝලීය භාවිතයන් අනුව කටයුතු කිරීම සහතික කිරීම.
- සත්වෝද්‍යාන තුළ අඛණ්ඩ නඩත්තු කිරීම් සහ සේවකයන් සඳහා ශ්‍රේණිය/සේවා උසස් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.



පින්නවල අලි අනාතාගාරයේ අලි පැටවුන්

1.4 සංවිධාන සටහන

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයට අදාළ සංවිධාන සටහන පිටු අංක 04 හි දැක්වේ.



මූලාශ්‍රය - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

02. පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ජයග්‍රහණ

- පසුගිය වසර 10 තුළ සත්වෝද්‍යානය වාර්තා කළ වැඩිම ආදායම 2025 වර්ෂයේදී වාර්තා වී ඇත. එය 2024 වර්ෂයේ වාර්තා කළ ආදායමට සාපේක්ෂව සියයට 6.5 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.
- සත්ත්ව හුවමාරු ක්‍රමය ඔස්සේ වසර 20 කට ආසන්න කාලයකට පසුව හයිනා සහ දුඹුරු වලසුන් වැනි සතුන් දේශීය සත්වෝද්‍යාන වෙත ගෙන්වා ගැනීමට හැකි වීම.
- IUCN රතු දත්ත පොතට අනුව දැඩි ලෙස තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ අභිජනනය හා නැවත ස්වාභාවික පරිසරයට මුදා හැරීමට කටයුතු කිරීම.

2.2 ප්‍රගතිය

2.2.1 2025.12.31 දිනට සංචාරක පැමිණීම සහ ආදායම

2025 වර්ෂයේ දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත දේශීය හා විදේශීය සංචාරකයින්ගේ පැමිණීම හා එම වසරේ ප්‍රවේශපත්‍ර ආදායම වගු සටහන 2.1 හා 2.2 මඟින් පෙන්නුම් කෙරේ.

වගු සටහන 2.1
2025 වසරේ සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)

මාසය	සංචාරක පැමිණීම			ආදායම (රු.මි.)			
	දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	එකතුව
ජනවාරි	113,000	30,343	143,343	32.98	122.39	10.71	166.07
පෙබරවාරි	108,798	25,759	134,557	29.78	109.53	11.04	150.36
මාර්තු	124,945	25,608	150,553	32.04	104.72	11.20	147.96
අප්‍රේල්	160,960	17,582	178,542	44.11	68.58	9.85	122.54
මැයි	114,650	15,515	130,165	30.50	53.73	7.22	91.45
ජූනි	126,729	13,032	139,761	32.36	43.10	9.23	84.68
ජූලි	212,156	18,987	231,143	47.03	73.50	13.58	134.11
අගෝස්තු	411,714	18,834	430,548	96.68	90.39	16.08	203.14
සැප්තැම්බර්	220,039	19,546	239,585	54.11	63.71	12.16	129.99
ඔක්තෝබර්	125,671	21,152	146,823	33.91	76.14	8.06	118.11
නොවැම්බර්	132,826	19,438	152,264	36.10	80.18	11.48	127.76
දෙසැම්බර්	89,320	24,949	114,269	26.92	96.88	10.68	134.48
එකතුව	**1,940,808**	**250,745**	**2,191,553**	**496.51**	**982.84**	**131.29**	**1610.64**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 2.2
දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරක පැමිණීම සහ ආදායම - 2025

ආයතනය/ ජාතික උද්‍යානය		සංචාරක පැමිණීම			ආදායම (රු.මි.)			
		දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	එකතුව
1	දෙහිවල සත්වෝද්‍යානය	962,300	12,257	974,557	222.36	49.36	32.26	303.98
2	පින්නවල අලි අනාථාගාරය	438,637	196,381	635,018	97.39	848.33	50.33	996.05
3	පින්නවල සත්වෝද්‍යානය	297,515	35,221	332,736	66.23	53.14	14.67	134.04
4	රිදියගම සෆාරි උද්‍යානය	242,356	6,886	249,242	110.52	32.01	34.03	176.56
	එකතුව	**1,940,808**	**250,745**	**2,191,553**	**496.51**	**982.84**	**131.29**	**1,610.64**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

පහත වගු සටහන 2.3 අනුව, 2024 හා 2025 වර්ෂවල ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට පැමිණි සංචාරක සංඛ්‍යාව සහ එමඟින් ලැබූ ආදායම මාසික වශයෙන් සංසන්දනය කර ඇත. 2024 වර්ෂය සමඟ සැසඳීමේදී 2025 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම සියයට 6.47 කින් වැඩිවී ඇති බව දක්නට ලැබෙන අතර, සංචාරක පැමිණීම සියයට 0.29 කින් පමණ සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. ඒ අනුව, 2024 වර්ෂයේ මිලියන 2.18 ක් වූ සමස්ත සංචාරක පැමිණීම 2025 වර්ෂයේදී මිලියන 2.19 ක් දක්වා වැඩි වී ඇති බව වාර්තා වේ.


මෙම තත්ත්වය අනුව සංචාරක පැමිණීමේ වර්ධනය සීමිත මට්ටමක පැවති නමුත්, ප්‍රවේශ ගාස්තු සංශෝධන, සේවා පහසුකම් වැඩිදියුණු කිරීම සහ කළමනාකරණ කාර්යක්ෂමතාව ඉහළ යාම වැනි කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සමස්ත ආදායම වැඩිවීමට හේතු වී ඇති බව නිරීක්ෂණය කළ හැක.

වගු සටහන 2.3
2024 - 2025 වර්ෂය දක්වා සංචාරකයන්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)

මාසය	සංචාරක පැමිණීම		ආදායම (රු.මි.)	
	2024	2025	2024	2025
ජනවාරි	235,803	143,343	182.59	166.07
පෙබරවාරි	132,729	134,557	152.71	150.36
මාර්තු	124,206	150,553	132.95	147.96
අප්‍රේල්	157,642	178,542	110.76	122.54
මැයි	118,896	130,165	78.84	91.45
ජූනි	103,895	139,761	70.75	84.68
ජූලි	176,942	231,143	116.93	134.11
අගෝස්තු	393,705	430,548	166.39	203.14
සැප්තැම්බර්	224,527	239,585	110.82	129.99
ඔක්තෝබර්	154,058	146,823	100.61	118.11
නොවැම්බර්	107,529	152,264	108.78	127.76
දෙසැම්බර්	255,299	114,269	180.69	134.48
එකතුව	**2,185,231**	**2,191,553**	**1,512.83**	**1610.64**


මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 2.1 : 2025 වසරේ සංචාරකයින්ගේ පැමිණීම (මාසිකව)



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 2.2 : 2025 වසරේ දෙපාර්තමේන්තුවේ ආදායම (මාසිකව)




මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

වගු සටහන 2.4
2010 වසරේ සිට 2025 වර්ෂය දක්වා සංචාරක පැමිණීම සහ ආදායම

වර්ෂය	සංචාරක පැමිණීම	ආදායම (රු.මි.)
2010	2,324,360	587.74
2011	2,438,635	651.38
2012	2,196,704	645.29
2013	2,172,810	719.87
2014	2,042,887	906.50
2015	2,781,380	1,034.87
2016	2,959,737	1,097.66
2017	2,885,955	998.62
2018	3,097,341	1,006.42
2019	2,443,028	766.13
2020	683,698	204.73
2021	544,654	109.57
2022	2,185,631	535.09
2023	2,361,116	1,089.97
2024	2,185,231	1,512.83
2025	2,191,553	1,610.64


මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 2.3 : 2010 - 2025 වර්ෂය දක්වා සංචාරක පැමිණීම



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 2.4 : 2010 - 2025 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුවේ ආදායම රු.මි.



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ඉහත ප්‍රස්තාර සටහන අනුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සංචාරක පැමිණීම හා ප්‍රවේශපත්‍ර ආදායම 2010 වසරේ සිට 2018 වසර දක්වා ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කරයි. එහෙත් 2019 සිට 2021 දක්වා කාලය තුළ සංචාරක පැමිණීම හා ආදායම සීඝ්‍ර ලෙස පහළ යාමක් දක්නට ලැබේ. මෙම තත්ත්වයට ලොව පුරා ව්‍යාප්ත වූ කොවිඩ්-19 වසංගතය ප්‍රධාන වශයෙන් බලපා ඇති බව පැහැදිලි වේ. 2022 වසරෙන් පසුව සංචාරක ක්ෂේත්‍රය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ සංචාරක පැමිණීම හා ආදායම නැවතත් වර්ධනයක් පෙන්නුම් කර ඇත.

ඒ අනුව, 2024 වසරේදී සංචාරක පැමිණීම 2,185,231 ක් ලෙස වාර්තා වී ඇති අතර, 2025 වසරේදී එය 2,191,553 දක්වා තවදුරටත් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. එමෙන්ම ප්‍රවේශපත්‍ර ආදායම 2024 වසරේ රු. මිලියන 1,512.83 ක් ලෙස වාර්තා වූ අතර, 2025 වසරේදී එය රු. මිලියන 1,610.64 දක්වා ඉහළ ගොස් ඇති බව දක්නට ලැබේ. කෙසේ වෙතත්, 2016 වසරේ වාර්තා වූ ඉහළම සංචාරක පැමිණීම සමඟ සසඳන විට 2025 වසරේ සංචාරක පැමිණීම තවමත් සියයට 25.95 කින් පමණ අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය කළ හැක.

2.2.2 2025.12.31 වන දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය

වගු සටහන 2.5
2025.12.31 දිනට ප්‍රතිපාදන හා වියදම් තොරතුරු සාරාංශය (ඒකාබද්ධ අරමුදල)

වියදම් කාණ්ඩය	2025 ඇස්තමේන්තු මුදල (රු.මි.)	2025.12.31 දිනට වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය %
මූලධන වියදම්	167.00	95.02	57%
පුනරාවර්තන වියදම්	784.00	771.73	98%
එකතුව	**951.00**	**866.75**	

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 2.6
2025.12.31 දිනට වියදම් තොරතුරු සාරාංශය (සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල)

වියදම් කාණ්ඩය	2025 ඇස්තමේන්තු මුදල (රු.මි.)	2025.12.31 දිනට වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය %
මූලධන වියදම්	450,370	383,495	85%
පුනරාවර්තන වියදම්	1,377,500	1,276,782	93%
එකතුව	**1,827,870**	**1,660,277**	

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

2.2.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගති සාරාංශය

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් හා සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල මඟින් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත වගු අංක 2.7 හා 2.8 මඟින් දක්වා ඇත.

වගු සටහන 2.7
2025.12.31 දිනට ඒකාබද්ධ අරමුදලේ සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගති සාරාංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය	
		(රු.මි.)	(රු.මි.)	%
1	ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරීම	18.00	14.39	80%
2	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	6.00	5.89	98%
3	මානව සම්පත් සංවර්ධනය	2.00	1.65	82%
4	දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය (1)	53.00	29.72	56%
5	පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය (2)	40.00	19.42	49%
6	පින්නවල සත්වෝද්‍යානය සංවර්ධනය (3)	17.00	14.21	84%
7	රිදියගම සෆාරි උද්‍යානය සංවර්ධනය (4)	31.00	9.74	31%
	එකතුව	**167.00**	**95.02**	**57%**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 2.8
2025.12.31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන සහ සුඛ සාධක අරමුදලේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගති සාරාංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රතිපාදන		මූල්‍ය ප්‍රගතිය
		(රු.මි.)	(රු.මි.)	%
1	දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය	106.00	105.60	99%
2	රිදියගම සෆාරි උද්‍යානය සංවර්ධනය	172.27	141.10	82%
3	පින්නවල සත්වෝද්‍යානය	40.50	33.53	83%
4	පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය	110.00	91.55	83%
5	නව ඉදිකිරීම් සඳහා උපකරණ අත්පත් කර ගැනීම	17.10	9.87	58%
6	සතුන් මිල දී ගැනීම	.50	.04	8%
7	වෛද්‍ය උපකරණ මිලදී ගැනීම	1.00	.40	40%
8	සතුන් අත්පත් කර ගැනීම සඳහා දරනු ලබන වියදම්	3.00	1.38	46%
	එකතුව	**450.37**	**383.49**	**85%**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

2.2.4 2025.12.31 වන දිනට සත්ව එකතුව

වගු සටහන 2.9
2025.12.31 දිනට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මුළු සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින්ගේ ප්‍රමාණය
දෙහිවල ජාතික සත්වෝද්‍යානය			
1	ක්ෂීරපායි	62	258
2	පක්ෂි	67	734
3	උරග	53	249
4	මත්ස්‍යයින් හා වෙනත් මුහුදු ජීවීන්	56	2112
	එකතුව	**238**	**3353**
පින්නවල අලි අනාථාගාරය			
1	ක්ෂීරපායි - ආසියානු අලි	01	65
	එකතුව	**01**	**65**
පින්නවල සත්වෝද්‍යානය			
1	ක්ෂීරපායි	21	154
2	පක්ෂි	16	117
3	උරග	06	35
	එකතුව	**43**	**306**

රිදියගම සෆාරි උද්‍යානය			
1	ක්ෂීරපායි	30	742
2	පක්ෂි	31	152
3	උරග	04	600
	එකතුව	**65**	**1494**
ගෝනපොල උද්‍යානය			
1	ක්ෂීරපායි	02	04
2	පක්ෂි	06	234
	එකතුව	**08**	**238**
2025.12.31 දිනට මුළු සත්ත්ව විශේෂ සංඛ්‍යාව හා එකතුව		**255**	**5456**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

2.2.5 සත්ත්ව හුවමාරු වැඩසටහන් හා සතුන් මිලදී ගැනීම

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සහ සේවක පරිපාලනය මෙන්ම සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි. සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට සතුන් ලබාගැනීමේ ප්‍රධානතම මාර්ගය විදේශීය සත්වෝද්‍යාන සමඟ සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. මෙමඟින් දෙපාර්තමේන්තුවේ සත්ත්ව විශේෂ සංඛ්‍යාව ඉහළ නැංවීම, නව ජාන එකතු කිරීම තුළින් අභිජනන වැඩසටහන් විධිමත් කර නිරෝගී සත්ත්ව පරම්පරාවක් ඇති කිරීම අරමුණු කරනු ලබයි.

2025 වර්ෂයේ දී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රමය යටතේ සිදු කරන ලද සත්ත්ව හුවමාරු පිළිබඳ විස්තර පහත වගු සටහන 2.10 මඟින් දැක්වේ.

වගු සටහන 2.10
2025.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ගෙන්වන ලද සතුන්

හුවමාරු කරගන්නා ලද සතුන්	හුවමාරු ක්‍රමය / ප්‍රදානය කිරීම	සතුන් සංඛ්‍යාව		හුවමාරුව සිදු කරන ලද දිනය	හුවමාරුව සිදු කරන ලද රට සහ සත්වෝද්‍යානය
		ගැහැණු	පිරිමි		
හයිනා (*Crocuta crocuta*)	හුවමාරු ක්‍රමය	01	01	2025.02.10	එක්සත් අරාබි එමීර් රජයේ කැපිටල් සත්වෝද්‍යානය හා වනජීවී උද්‍යානය
දුඹුරු වළසා (*Ursus arctos*)	හුවමාරු ක්‍රමය	01	01	2025.02.10	එක්සත් අරාබි එමීර් රජයේ කැපිටල් සත්වෝද්‍යානය හා වනජීවී උද්‍යානය
කෙටි වලිග මියර්කැට් (*Suricata surivatta*)	හුවමාරු ක්‍රමය	03	03	2025.02.10	එක්සත් අරාබි එමීර් රජයේ කැපිටල් සත්වෝද්‍යානය හා වනජීවී උද්‍යානය

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

වගු සටහන 2.11
2025.12.31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන ලද සතුන්

හුවමාරු කරගන්නා ලද සතුන්	හුවමාරු ක්‍රමය / ප්‍රදානය කිරීම	සතුන් සංඛ්‍යාව		හුවමාරුව සිදු කරන ලද දිනය	හුවමාරුව සිදු කරන ලද රට සහ සත්වෝද්‍යානය
		ගැහැණු	පිරිමි		
දඩු ලේනා (*Ratufa macroura*)	හුවමාරු ක්‍රමය	01	01	2025.02.22	The National Aquarium LLC, එක්සත් අරාබි එමීර් රජයේ
දිය බල්ලා (*Prionailurus viverrinus*)	හුවමාරු ක්‍රමය	01	01	2025.02.17	එක්සත් රාජධානියේ, එක්ස්මූර් සත්වෝද්‍යානය

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

2.2.6 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආයතන සහ එම ආයතනයන්හි කාර්යයන්



2.2.6.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය

අක්කර 23 ක භූමි භාගයක් පුරා පැතිරී ඇති දෙහිවල ජාතික සත්වෝද්‍යානය දේශීය හා විදේශීය ක්ෂීරපායී, පක්ෂි, උරග සහ මත්ස්‍ය විශේෂ රාශියකින් සමන්විත අධ්‍යාපනික වටිනාකමකින් යුත් සත්ත්ව එකතුවක් පවත්වාගෙන යනු ලබයි. දෙපාර්තමේන්තුවට අයත් එකම මින් මැදුර දෙහිවල සත්වෝද්‍යානය තුළ පවතින අතර, කරදිය හා මිරිදිය මත්ස්‍යයින් අභිජනනය හා සංරක්ෂණය කිරීමත් නැවත ස්වභාවික පරිසරයට වෙත මුදා හැරීමත් සිදු කරනු ලබන අතර, මීට අමතරව වෙනත් මුහුදු ජීවීන් සංරක්ෂණය සිදු කිරීම ද පර්යේෂණ මට්ටමින් සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවට අයත්ව පවතින පැටව් රැකබලා ගැනීමේ මධ්‍යස්ථානය දෙහිවල සත්වෝද්‍යානය තුළ ස්ථාපිත කර ඇති අතර, මෙහිදී නිතිවිරෝධී ස්ථාන වැටලීම් මඟින් හසුවූ පැටව් රැකබලා ගැනීම සඳහා ද මෙම ස්ථානයට යොමු කරනු ලබයි. වර්තමානය වනවිට ලොව පුරා ඉතා ජනාදරයට පත් "හයිඩර්" සිංහ පැටවා දෙහිවල සත්වෝද්‍යානයේ පැටව් අංශය මඟින් රැකබලාගත් සත්ත්වයින් අතරට එක් වේ.

දෙහිවල සත්වෝද්‍යානය නවීන සංකල්ප වලට ගැලපෙන පරිදි සත්ත්ව සුබසාධනය ඉහළ මට්ටමක පවත්වා ගනිමින් සත්ත්ව අරණවල් නවීකරණය කිරීම බොහෝ දුරට සිදු කර ඇති අතර, රට ආර්ථික අර්බුධයකට ලක්ව පැවතියත් සත්ත්ව අරණවල් අළුත්වැඩියා කිරීමේ කටයුතු ද තවදුරටත් සිදු කරමින් පවති.

වගු සටහන 2.12
2025.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී	62	258
2	පක්ෂි	67	734
3	උරග	53	249
4	මත්ස්‍යයින් හා වෙනත් මුහුදු ජීවීන්	56	2112
	එකතුව	**238**	**3353**

මූලාශ්‍රය : දෙහිවල ජාතික සත්වෝද්‍යානය

වගු සටහන 2.13
2025.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී	10	17
2	පක්ෂි	4	12
3	උරග	3	55
4	මත්ස්‍යයින් හා වෙනත් මුහුදු ජීවීන්	11	305
	එකතුව	**28**	**389**

මූලාශ්‍රය : දෙහිවල ජාතික සත්වෝද්‍යානය

වගු සටහන 2.14
2025 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්

අනු අංකය	වැඩසටහන්	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	අධ්‍යාපනික දේශන හා ප්‍රායෝගික වැඩමුළු	විශ්වවිද්‍යාල සිසු සිසුවියන් හා ආචාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා සත්ත්ව චර්යා, සර්පයන්, කුරුල්ලන්, සත්වෝද්‍යාන ඉතිහාසය හා අණ පනත්, පිළිබඳ දේශන.	15
		පාසල් සිසු සිසුවියන් සඳහා සර්පයන්, අප අවට ජීවත්වන සතුන්, ජෛව විවිධත්වය, ආවේණික ශාක හා සතුන්, පිළිබඳ දේශන.	01
		රාජ්‍ය ආයතන (වනජීවී අඩවි ආරක්ෂක, නාවික හමුදා, ගිනි නිවීම්) සඳහා සර්පයන් හඳුනා ගැනීම හා හැසිරවීම, සංරක්ෂණයට දායක වන ආකාරය පිළිබඳ දේශන.	03
		පාසල් සිසු සිසුවියන්, විශ්වවිද්‍යාල සිසුන් හා නරඹන්නන් සඳහා සත්ත්ව චර්යා ප්‍රවර්ධන වැඩසටහන්.	20
		විශ්ව විද්‍යාල, පාසල් හා බාහිර ආයතන සඳහා ජීවී හා අජීවී නිදර්ශක සහිත ප්‍රදර්ශන කුටි සැපයීම.	11
02	පර්යේෂණ	i. "Comparative Analysis of Growth Rate in Rotala *(Rotala rotundifolia)* Under Different Fertilization Regimes." Ms. A.M.D.S.Tilakarathna - Ocean University ii. "Effect of Diffent Feeds on Colour enhancement in Endemic Cherry Barb under Controlled Conditions". Ms. S.G.S.Sandalika - Ocean University iii. "Aquatic Vegetation as a Vital Factor: Enhancing Growth and Survival Rate of Cherry Barb in Captivity" Ms. D.O.Y.Dahanayaka - Ocean University iv. "Visitor Expectations Vs Actual Experience at the Dehiwala Zoo Aquarium". Ms. M.G.S.S.Sathsarani - Ocean University v. "The influence of Aquascape Environments on The Reproductive performance of Endemic Barred Danio Fish species in Sri Lanka." Ms. H.M.G.S.Herath -Ocean University vi. "Development of a Value – Added Feed and Its Impact on the Guppy Juvenile under Semi Controlled Out door Conditions at The National Zoological Garden." Ms.G.G.Sachinee - Ocean University vii. "Comparative Assessment of attitudes and actioned among visitors and employees about the conservation and other roles"- Ms.Piula Sivanessan-University of Peradeniya viii. "Assess the stress behavior of selected captive mammals in Dehiwala & Pinnawala Zoo to improve animal maintenance facilities"-Mr.S.Nithusan- University of Peradeniya ix. "Assess the stress behavior of selected captive mammals in Dehiwala & Pinnawala Zoo to improve animal maintenance facilities"-Ms.R.K.J.Wasala-University of Kelaniya x. "Optimizing the use of urban plant communities in Colombo. Investigating ideal plant combinations for sustainable urban ecosystems to combat HIE and capture fine particulate matter"- Ms.Vishaka Edirisinghe -Horizen campus. xi."Assessing the presence of Macro and Microplastic in the Sri Lanka Leopard." Ms.D.U.Sewwandi – Sabaragamuwa University.	11

03	පුහුණු වැඩසටහන්/සේවක සුබසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	ශ්‍රී ලංකාවේ ඇති විවිධ රාජ්‍ය හා පුද්ගලික විශ්වවිද්‍යාල සිසුන්, උසස් අධ්‍යාපනික ආයතන වල ඩිප්ලෝමාධාරී සිසුන් සඳහා ආයතනික පුහුණුව (සති 6 - මාස 6 දක්වා).	20
		NVQ Level 4 හස්ති භාරකරු සේවාස්ථ පුහුණුව.	01
		පෞද්ගලික පාසල් වලින් වැඩබිම් පරිසරයකට යොමු කිරීම් පුහුණු කිරීම.	01
		පශු වෛද්‍ය සිසුන් සඳහා සීමාවාසික පුහුණු.	20
		ස්වේච්ඡා සේවක පුහුණු.	02
04	විශේෂ වැඩසටහන්	■ විනෝදාස්වාදය,දැනුම හා සත්ත්ව කරුණාව පෙරදැරිව පවත්වනු ලබන උපන්දින සාද ■ 2025.01.01-2025 වර්ෂය පිළිගනිමින් අධ්‍යක්ෂ ජනරාල්තුමා ප්‍රමුඛ සියළුම මාණ්ඩලික නිලධාරීන් හා කාර්යය මණ්ඩලය විසින් නව වසර උදාව සැමරීම. ■ 2025.02.09 Clean Sri Lanka වැඩසටහනට සමගාමීව දෙහිවල වෙරළ තීරය පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් පැවැත්වීම. ■ 2025.04.16 දෙහිවල සත්වෝද්‍යානයේ වාසය කරන සත්ත්වයන්ට ආශීර්වාද කරමින් සිංහල අළුත් අවුරුදු හිසතෙල් ගෑමේ උත්සවය මහා සංඝරත්නය ප්‍රමුඛ කාර්යය මණ්ඩලය විසින් උත්සවශ්‍රීයෙන් සැමරීම. ■ 2025.07.09 එළඹෙන ඇසල පොහොය නිමිත්තෙන් සත්වෝද්‍යාන කාර්යය මණ්ඩලයට හා සත්වෝද්‍යාන සත්ත්වයින්ට ආශීර්වාද කරමින් බණ දේශණයක් පැවැත්වීම. ■ 2025.10.01 ලෝක ළමා දින සැමරුම් වැඩසටහන. ■ 2025.12.25 නත්තල් උත්සවය වෙනුවෙන් නරඹන්නන්ට විනෝදාස්වාදයක් ලබා දීමේ අරමුණින් සත්වෝද්‍යානය සැරසීම.	

මූලාශ්‍රය : දෙහිවල ජාතික සත්වෝද්‍යානය

වගු සටහන 2.15
2025.12.31 දිනට දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන(රු.මි)	2025 සඳහා සත්‍ය වියදම(රු.මි)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	53.00	29.71	56%
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	106.00	105.60	99%
එකතුව	**159.00**	**135.31**	**85.10%**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

දෙහිවල සත්වෝද්‍යානයේ භෞතික ප්‍රගතිය

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්


ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
සත්ව අරණ ප්‍රතිසංස්කරණය කිරීම.	100%
අමුත්තන්ගේ පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම.	100%
ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.	85%
නිල නිවාස අලුත්වැඩියා කිරීම.	60%
කුඩා පරිමාණ සංවර්ධන කටයුතු.	100%
කහපොළ ගොවිපල ඉඩම් සංවර්ධනය සහ බාහිර ශ්‍රමික වැටුප් ගෙවීම්.	100%
ගෝනපොළ ගොවිපල ඉඩම් සංවර්ධනය සහ බාහිර ශ්‍රමික වැටුප් ගෙවීම්.	100%

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
මින්මැදුර සංවර්ධනය (ව්‍යුහාත්මක තක්සේරුව සැකසීම).	100%
වානර දූපත - අදියර 1.	100%
අනතුරුදායක රැහැන් ඉවත් කිරීම.	95%
සත්ව අරණ අලුත්වැඩියාව/ වැඩිදියුණු කිරීම.	100%
දෙහිවල සත්වෝද්‍යානයේ භූමි අලංකරණය.	100%
කුඩා පරිමාණ සංවර්ධන කටයුතු සහ හිපෝ පවිත්‍රාගාරය.	100%

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය




රූපය 2.1 - කහපොල ගොවි බිම් සංවර්ධනය



රූපය 2.2 - වානර දූපත - අදියර 1.

2.2.6.2 පින්නවල අලි අනාථාගාරය



වර්ෂ 1975.02.16 වැනි දින එවකට වරාය නාවික කටයුතු හා ගුවන් සේවා අමාත්‍යවරයා ව සිටි දිවංගත ජී.බී.ජී.කලුගල්ල මැතිතුමාගේ සංකල්පයක් අනුව, අක්කර විසි පහක බිම් කඩක් තුළ කුමාරි, මාතලි, විජය, කදිරා සහ නීලා යන අනාථ අලි පැටවුන් පස් දෙනෙකුගෙන් ආරම්භ කරන ලද පින්නවල අලි අනාථාගාරය මේ වන විට සිය ගමන් මගේ 50 වන වර්ෂය පසු කරමින් සිටියි.

ප්‍රථමයෙන් ම මෙය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු විෂය පථය යටතේ ක්‍රියාත්මක වී ඇති අතර වර්ෂ 1982 දී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතට ඇතුළත් කර ඇත. අලි ඇතුන් සංරක්ෂණය හා අභිජනනය මුඛ්‍ය අරමුණ ලෙස සලකමින් මෙය ආරම්භ කළ ද මේ වන විට සත්ත්ව සුබසාධනය, අභිජනනය, සංචාරක ව්‍යාපාරය, අධ්‍යාපන හා පර්යේෂණ කාර්යය හා විනෝදාස්වාදය යන පුළුල් අරමුණු තෙක් වර්ධනය වී එහි කාර්ය භාරය තවදුරටත් පුළුල් වී ඇත.

පින්නවල අලි අනාථාගාරය ආසියානු අලි ඇතුන් සංරක්ෂණ කිරීමේ හා අභිජනන මධ්‍යස්ථානයක් ලෙසින් ලොව ප්‍රමුඛ ව කටයුතු කරන ස්ථානයක් වන අතර ආසියානු අලි ඇතුන් විශාල අලි රංචුවක් ලෙසින් එකවර ලොව දැකිය හැකි එකම ස්ථාන ලෙසින් ද දෙස් විදෙස් සංචාරකයින් අතර ප්‍රචලිත ය.

ස්වාභාවික පරිසරයට ආසන්න පරිසරයක් තුළ දිවි ගෙවන පින්නවල අලි ඇතුන් අතුරෙන් විජය නම් අලි පියාටත් කුමාරි නම් අලි මවටත් දාව 1984 වර්ෂයේ දී උපත ලබන ලද සුකුමලී නම් අලි පැටවා මෙහි පළමු අලි උපත ලෙස වාර්තා වේ. එතැන් පටන් මේ වන විට ස්වාභාවික අලි උපත් 76ක් සිදු වෙමින් සාර්ථක සත්ත්ව අභිජනන ක්‍රියාවලියක් අඛණ්ඩව සිදු කරගනිමින් පවතී. 2021 වර්ෂයේ අලි අභිජනනය සම්බන්ධව සුවිශේෂී සිදුවීමක් ලෙස පින්නවල අලි අනාථාගාරයේ ප්‍රථම නිවුන් අලි උපත සිදු විය.

වගු සටහන 2.16
2025.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව එකතුව සත්ත්වයින් ප්‍රමාණය

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී - ආසියානු අලියා	01	65
	එකතුව	**01**	**65**

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන 2.17
2025.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී - ආසියානු අලියා	01	00
	එකතුව	**01**	**00**

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන 2.18
2025 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්

අනු අංකය	වැඩසටහන්	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	අධ්‍යාපනික දේශන හා ප්‍රායෝගික වැඩමුළු	විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම්, දේශන හා ප්‍රායෝගික වැඩමුළු සිදු කිරීම.	06
		පාසල් ළමුන්, පෙර පාසල් කණ්ඩායම්, දහම් පාසල් සහ වෙනත් කණ්ඩායම් සඳහා අධ්‍යාපනික වැඩසටහන් සිදු කිරීම	58
		විදේශීය දූත පිරිස් හා රාජතාන්ත්‍රික අමුත්තන් සඳහා මාර්ගෝපදේශනය.	02
		රූපවාහිනී, සමාජ මාධ්‍ය වීඩියෝ වැඩසටහන් සිදු කිරීම	03
		අධ්‍යාපනික ප්‍රදර්ශන සිදු කිරීම.	03
02	පර්යේෂණ	i. The Socioeconomic Impact of Pinnawala Elephant Orphanage on Local Communities ii. Design and Development of a Computer-Based Project: Implementing an Elephant Information Handling System iii. Sri Lankan Elephants as a Socio-Cultural Element: Communicating to Tourists on Elephants at Pinnawala Elephant Orphanage iv. Morphological and Molecular Characterization of Coprophilous Fungi (Magic Mushrooms) Occurring in Sri Lanka v. Honeybee–Elephant Repellent System vi. Is There a Trend of Increasing Gastrointestinal Parasite Prevalence in Captive and Wild Elephants in Sri Lanka? vii. Assessing Stress Behaviour of Selected Captive Mammals in Dehiwala and Pinnawala Zoos to Improve Animal Maintenance Facilities viii. Development of a Technological System to Prevent Elephant–Train Collisions ix. Contribution of Ethical Marketing Practices to a Sustainable Elephant Tourism Industry in Sri Lanka x. Human- Elephant bond xi. Prevalence of Gastrointestinal Parasites in captive elephants at Pinnawala Elephant Orphanage. xii. Assess the stress behavior of selected captive mammals in Dehiwala and Pinnawala Zoo xiii. Pinnawala Elephant Orphanage Management system xiv. A case study on environmental sustainability challenges and opportunities at Pinnawala Elephant Orphanage.	14

03	පුහුණු වැඩසටහන්/සේවක සුබසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්.	**<u>පුහුණු වැඩසටහන්</u>** i. මැලේරියා මර්ධන වැඩසටහන. ii. විෂ මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම හා ඒ සම්බන්ධ විනය ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම. iii. අල්ලස් හා දූෂණය වැළැක්වීම සම්බන්ධ පුහුණු වැඩසටහන iv. මානසික සුවතාවය වර්ධනය සඳහා වැඩමුළුවක් පැවැත්වීම.	04
		<u>සේවක සුබසාධනය වැඩසටහන්</u> i. පින්නවල අලි අනාථාගාරයේ ස්වර්ණ ජයන්ති සැමරුම් වැඩසටහනට සමගාමීව බටහිර වෛද්‍ය සායනය. ii.කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ දායකත්වයෙන් දේශීය වෛද්‍ය සායනය. iii. ක්ෂය රෝග පරීක්ෂා කිරීමේ වැඩසටහන.	03
04	විශේෂ වැඩසටහන්	■ 2025.02.16 - ස්වර්ණ ජයන්ති සැමරුම- 2025. ■ 2025.04.15 - අලි ඇතුන්ගේ හිසතෙල් ගෑමේ උත්සවය. ■ 2025.06.05 - ලෝක පරිසර දින වැඩසටහන. ■ 2025.08.12 - ලෝක අලි දිනය සැමරීම. ■ 2025.10.01 - ලෝක ළමා දින සැමරුම් වැඩසටහන. ■ 2025.06.05 - ලෝක පරිසර දින වැඩසටහන	

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන 2.19
2025.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)	2025 සඳහා සත්‍ය වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය ٪
රජයේ ඒකාබද්ධ අරමුදල	40.00	19.42	49٪
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	110.00	91.55	83٪
එකතුව	**150.00**	**110.97**	**74٪**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

පින්නවල අලි අනාථාගාරයේ භෞතික ප්‍රගතිය

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
දැනට පවතින අලි ගාල් ප්‍රතිසංස්කරණය (බිම කොන්ක්‍රීට් / වහල අලුත්වැඩියා).	100٪
මෝදරවත්ත රථගාල සංවර්ධනය.	100٪
මෝදරවත්ත රථගාල සංවර්ධනය - අදියර II (මට්ටම් කිරීම සහ ගල් ඇතිරීම).	25٪
පලතුරු කැවීමේ කුටිය (බිම කොන්ක්‍රීට්) ප්‍රතිසංස්කරණය කිරීම.	90٪
දෙමහල් සේවක විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.	40٪
මෝදරවත්ත රථගාලේ භූමි සකස් කිරීම.	100٪
භූමි අලංකරණය, භූමි වැඩිදියුණු කිරීම සහ පාංශු බාදනය වැළැක්වීම.	75٪

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
නව අලි ගාල් ප්‍රදේශයේ දෙවන අදියරේ පවතින අලි ගාල් ප්‍රතිසංස්කරණය (නීල්ගිරි ගාල් හි බිම කොන්ක්‍රීට්/ වහල අලුත්වැඩියාව).	85%
මද කිපුණු අලින් සඳහා අරණක් ඉදිකිරීම (අදියර - 01).	100%
මද කිපුණු අලින් සඳහා අරණක් ඉදිකිරීම (අදියර - 02).	10%
කාර්යාල ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීම.	100%
අභ්‍යන්තර මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම - ඉතිරි වැඩ.	100%
සත්ව රෝහල් ප්‍රතිසංස්කරණය - ඉතිරි වැඩ.	100%
කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහලේ ඉතිරි වැඩ කටයුතු - ඉතිරි වැඩ.	100%
දැනට පවතින තනි අලි ගාල් තුන (ගල් ඇතුරන ලද අරණ) සඳහා වහල ඉදිකිරීම.	45%
නව අලි මඩු ප්‍රදේශයේ අමුත්තන් සඳහා කුඩා ගිමන්හලක් ඉදිකිරීම.	70%
දියගම ගොවිපල සංවර්ධනය ("C" කොටස).	100%
කුඩා පරිමාණ සංවර්ධන කටයුතු.	90%

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය



රූපය 2.3 - මද කිපුණු අලින් සඳහා අරණක් ඉදිකිරීම (අදියර - 01).



රූපය 2.4 - මද කිපුණු අලින් සඳහා අරණක් ඉදිකිරීම (අදියර - 02).



රූපය 2.5 - කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහලේ ඉතිරි වැඩ කටයුතු - ඉතිරි වැඩ.



රූපය 2.6 - අභ්‍යන්තර මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම - ඉතිරි වැඩ.

2.2.6.3 පින්නවල සත්වෝද්‍යානය



සබරගමුව පළාතේ, කෑගලු දිස්ත්‍රික්කයේ රඹුක්කන - කෑගල්ල මාර්ගයේ සුන්දර මා ඔය නදියට සමීපව එහි දකුණු ඉවුරේ, පින්නවල අලි අනාථාගාරය පෙනෙන මානයේ මනස්කාන්ත භූදර්ශනයක් සහිත චමත්කාර ජනක පරිසරයක ශ්‍රී ලංකාවේ ප්‍රථම එලිමහන් සත්වෝද්‍යානය ලෙස පින්නවල සත්වෝද්‍යානය නිර්මාණය කර ඇත.

අක්කර 36 ක් පුරා පැතිර ඇති සත්වෝද්‍යානය 2015 අප්‍රේල් මස 17 වන දින දෙස් විදෙස් සංචාරකයින් සඳහා විවෘත කරන ලදී. සංචාරකයින් සනහාලන විනෝද පාරාදීසයක් ලෙසත්, පාසල් සිසු දරුවන්ගේ දැනුම් පිපාසය නිවාලන සජීවී පංතිකාමරයක් ලෙසත්, විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන විද්‍යාර්ථයින්, ආචාර්ය මණ්ඩලය හා පර්යේෂකයින් සඳහා ක්‍රියාකාරී සජීවී පර්යේෂණ මධ්‍යස්ථානයක් මෙන්ම නිදහස් ගවේෂකයින් හා සත්ත්වවේදීන් වෙනුවෙන් සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ලෙසත් ක්‍රියාත්මක පින්නවල සත්වෝද්‍යානය සතුන්ගේ ස්වභාවික චරියාවන් හා පාරිසරික තත්වයන්ට ආසන්න ලෙස නිමවන ලද සත්ව අරණ වලින් සමන්විත වේ.

සුරතල් සත්ව අරණ හාවන්, තාරවන්, පාත්තයන්, ඉබ්බන්, චීන පාත්තයින් කළු සහ සුදු හංසයින්ගෙන් සමන්විත වන අතර, ලංකාව තුළ ජීවත් වන මුව වර්ගවලින් මුව අරණ සමන්විතවේ. ඔරෙක්ස් ගව අරණ, පෝනීන් සහ බූරුවන්ගේ අරණ පින්නවල සත්වෝද්‍යානයට නැවුම් වූ අත්දැකීමක් එක් කරන අතර රජ සියක්කාරයින් සඳහා වෙන් වූ සියක්කාර අරණ සහ ලංකාවේ වෙසෙන හැල කිඹුලන් සහ ගැට කිඹුලන්ගෙන් කිඹුල් අරණ සමන්විත වේ.

ශ්‍රී ලංකාවට ආවේණික, කොටින්ගේ උප විශේෂයක් වන ශ්‍රීලංකාවේ දිවියන් සඳහා (ඔවුන්ට ආවේණික වූ සුවිශේෂී චාර්යාවන් වඩාත් ආසන්නයටම ගොස් නැරඹීමට හැකි වන ලෙස) වූ දිවි අරණත් දිවි අරණට යාබදව 2022 වසරේදී සත්වෝද්‍යානය වෙත අලුතින් හඳුන්වා දුන් රාජකීය බෙංගාලි ව්‍යාඝ්‍රයින් සඳහා වෙන් වූ බෙංගාලි ව්‍යාඝ්‍ර අරණත් ඉදිකර ඇත. ශ්‍රී ලංකාවේ වලසුන් සඳහා වූ වලස් අරණත්, ශාක භක්ෂක සතුන් සඳහා වන නිදහස් වන අරණ සහ විවෘත සමනල උයන ආදී වූ සත්ව අරණ මේ වන විට නරඹන්නන් අතර ජනප්‍රියතාවයට පත්ව ඇත.

සත්වෝද්‍යානයේ මිය යන සත්ව විශේෂ සංරක්ෂණය කරමින් නරඹන්නන් සඳහා දැනුම ලබාදීම පිණිස පින්නවල සත්වෝද්‍යානයේ කෞතුකාගාරය 2022 වර්ෂයේ සිට නරඹන්නන් වෙනුවෙන් විවෘත කර ඇත. තවද, නරඹන්නන් සඳහා සතුන් සමඟ සමීපවීමට අවස්ථාව ලබාදීම හා ඒ තුළින් නව ආදායම් උත්පාදන ක්‍රමවේද ඇති කිරීම අරමුණු කර ගනිමින් 2022 වර්ෂයේ අග භාගයේදී, වයස අවුරුදු 12ට අඩු දරුවන් සඳහා පෝනියා පිට ගමන් කිරීම, ශාක භක්ෂක සතුන් සඳහා ආහාර ලබාදීම, සර්පයින් සමඟ ඡායාරූප ගැනීමට අවස්ථාවක් ලබාදීම, කිඹුලන් හා මාංශ භක්ෂක සතුන් සඳහා ආහාර ලබාදීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී.

වගු සටහන 2.20
2025.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	21	154
2	පක්ෂි	16	117
3	උරග	06	35
	එකතුව	**43**	**306**

මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය

වගු සටහන 2.21
2025.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	08	16
	එකතුව	**08**	**16**

මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය

වගු සටහන 2.22
2025 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්

අනු අංකය	වැඩසටහන්	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	අධ්‍යාපනික දේශන හා ප්‍රායෝගික වැඩමුළු	කොළඹ විශ්වවිද්‍යාල සත්ව විද්‍යාව අධ්‍යයනාංශයේ අවසන් වසර සිසුන් සඳහා සිදු කරන ක්ෂේත්‍ර චාරිකාව.	01
		විවෘත විශ්වවිද්‍යාලයේ සත්ව විද්‍යා අධ්‍යනාංශයේ දෙවන වසර සිසුන් 70 ක ප්‍රමාණයක් සතුන්ගේ හැසිරීම් රටා අධ්‍යනය සම්බන්ධව ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාව.	01
		පරිසර අධිකාරිය සංවිධානය කළ වනජීවී දිනය වෙනුවෙන් දේශනයක් සඳහා සම්පත් දායකත්වය ලබා දීම.	01
		කෑගල්ල ශාන්ත ජෝෂප් බාලිකා මහා විද්‍යාලයෙහි පින්නවල සත්වෝද්‍යානයෙහි මාර්ගෝපදේශනයෙන් ඉදිකළ සමනළ උයන විවෘත කිරීම හා පරිසර නියමුවන් සඳහා නිල ලාංඡන පැළැන්දවීම.	01
		පරිසර සතිය නිමිත්තෙන් කෑගල්ල නගර ශාලාවේ පැවැත්වූ පාරිසරික ප්‍රදර්ශනය සඳහා පින්නවල සත්වෝද්‍යානයෙහි ප්‍රදර්ශන කුටියක් ලබා දීම	01
		කෑ/බැද්දේවෙල ප්‍රාථමික විද්‍යාලයේ අධ්‍යාපන ප්‍රදර්ශනයට සහභාගී වීම.	01
		පින්නවල මධ්‍ය මහා විද්‍යාපයේ අධ්‍යාපන ප්‍රදර්ශනයට සහභාගී වීම	01
02	පර්යේෂණ	සබරගමු විද්‍යාලයෙහි සිසුවෙකු පින්නවල සත්වෝද්‍යානයෙහි නරඹන්නන්ගේ අදහස් හා සත්ව සංරක්ෂණය පිළිබඳ පර්යේෂණයක් පැවැත්වීම	01
03	පුහුණු වැඩසටහන්/ සේවක සුබසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	I. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා අධ්‍යානංශයේ යෙහාරා දිසානායක විසින් දින 30 ක සේවාරම්භක පුහුණු පාඨමාලාව. II. රජරට විශ්වවිද්‍යාලය සත්ව විද්‍යා අධ්‍යානංශයෙහි සිසුන් 03 දෙනෙකු දින 15 ක කාලයක් සේවාරම්භක පුහුණුව ලැබීම. III. කැළණිය විශ්වවිද්‍යාල සත්ව විද්‍යා අධ්‍යනාංශයෙහි සිසුන දෙදෙනෙකු දින 15 ක කාලයක් පුහුණුව ලැබීම.	03

04	විශේෂ වැඩසටහන්	I. ලෝක වනජීවී දිනය සැමරීම. II. ලෝක වනාන්තර දින (රුක් රෝපණ) III. සත්වෝද්‍යාන සෙනෙහසේ දිනය IV. පින්නවල සත්වෝද්‍යාන දහවන සංවත්සරය. V. වෙසක් උත්සවය (දන් සැල) VI. ලෝක පරිසර සතිය - ප්ලාස්ටික් දිනය සඳහා පින්නවල සත්වෝද්‍යානයෙහි මාර්ගය දෙපස පිරිසිඳ කිරීම. - පින්නවල සත්වෝද්‍යානය තුළ පිරිසිඳු කිරීමේ වැඩසටහන - පාසල් සිසුන් හා සත්වෝද්‍යාන කාර්ය මණ්ඩලය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වනජීවී නියාමක ප්‍රගීත් මහතා විසින් වන ජීවී සංරක්ෂණය පිළිබඳ දේශන 02 ක් පැවැත්වීම. - පින්නවල සත්වෝද්‍යාන මායිමෙහි රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වීම. VII. ලෝක ව්‍යාඝ්‍ර දිනය (World Tiger Day) - මස් කේක් එකක් සැදීම. VIII. ලෝක ළමා දිනය සහ වැඩිහිටි දිනය සැමරීම. - ලීමර් පැටවාට නම් තැබීම - චිත්‍ර තරගයක් පැවැත්වීම - ළමා විනෝදාත්මක වැඩසටහන්

මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය

වගු සටහන 2.23
2025.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ මූල්‍ය ප්‍රගතිය

අරමුදල	2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)	2025 සඳහා සත්‍ය වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	17.00	14.21	84%
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	40.50	33.53	83%
එකතුව	**57.50**	**47.74**	**83%**

මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය

පින්නවල සත්වෝද්‍යානයේ භෞතික ප්‍රගතිය

රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
ක්‍රීඩා පිටිය ප්‍රදේශයේ ඇති පැරණි ගොඩනැගිල්ල අංක 1 ප්‍රතිසංස්කරණය කිරීම - අදියර 2.	100%
යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ.	100%
මායිම් Chain-link වැට වැඩිදියුණු කිරීම - අදියර 01 (හිඟ ගෙවීම).	100%
පිවිසුම් ගොඩනැගිල්ලේ වැසිකිළි සංකීර්ණය නවීකරණය කිරීම.	100%

මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
කුඩා බළල් පවුලේ සතුන් සඳහා අරණ ඉදිකිරීම - අදියර 02	100%
සුරතල් සතුන් සඳහා කුඩු	100%
දිවි අරණෙහි විදුලි වැට වැඩිදියුණු කිරීම.	100%
කුඩා පරිමාණ සංවර්ධනය හා උද්‍යාන අලංකරණ කටයුතු.	96%

මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය



රූපය 2.7 - බිළාල කුළයේ කුඩා සතුන් සඳහා අරණ



රූපය 2.8 - කුඩා පරිමාණ සංවර්ධනය



රූපය 2.9 - මායිම් චේන්ලින්ක් වැට සංවර්ධනය



රූපය 2.10 - පෝනියන් සඳහා අරණ

2.2.6.4 රිදියගම සෆාරි උද්‍යානය



ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අනුබද්ධිත සෆාරි උද්‍යානය අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. නව සත්වෝද්‍යාන සංකල්පයක් මත අක්කර අක්කර 500 ක වපසරියකින් පිහිටි මෙම ආයතනයේ පළමු අදියර 2016 මාර්තු 28 දින මහජනතාවට විවෘත කරන ලදි. පළමු අදියර යටතේ අප්‍රිකානු සිංහ කලාපය, ශාක භක්ෂක කලාපය, ආසියානු අලි කලාපය යන කලාප 03 මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත විය.

දෙවන අදියර යටතේ 2019 වසරේදී බෙංගාල ව්‍යාඝ්‍ර කලාපය සංචාරකයින් සඳහා විවෘත කළ අතර 2022 වර්ෂයේදී කුඩා සත්ත්ව රාජධානිය හා සමනල් උයන විවෘත කරන ලදි. කුඩා සත්ව රාජධානියේ සතුන් සුරතල් කිරීම, අලීන්ට කෑම කැවීම, පක්ෂීන්ට කෑම කැවීම, මත්ස්‍ය සම්බාහන ඒකකය යන ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදි.

වගු සටහන 2.24
2025.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	30	742
2	පක්ෂි	31	152
3	උරග	04	600
	එකතුව	**65**	**1494**

මූලාශ්‍රය : රිදියගම සෆාරි උද්‍යානය

වගු සටහන 2.25
2025.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සත්ත්ව උපත් ගණන

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	09	140
2	පක්ෂි	04	28
	එකතුව	**13**	**168**

මූලාශ්‍රය : රිදියගම සෆාරි උද්‍යානය

වගු සටහන 2.26
2025 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන

අනු අංකය	අධ්‍යාපනික වැඩසටහන් වර්ගය	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	අධ්‍යාපන, දේශන හා ප්‍රායෝගික වැඩමුළු	පින්නවල සත්වෝද්‍යාන 10 වන සංවත්සරය වෙනුවෙන් සිදුකරන ලද අධ්‍යාපනික ප්‍රදර්ශනය.	01
		පාසල් ළමුන් හා විවෘත විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම.	02
02	පර්යේෂණ	The Impact of the Auditory Aspect of Zoological Landscape on Visitors Enrichment: A Comparative Study Conducted at Ridiyagama safari Park, Mr.R.K.S. Jayawardhana, Department of Architecture University of Moratuwa	01
03	පුහුණු වැඩසටහන්/ සේවක සුභසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	■ දෙපාර්තමේන්තු අන්තර් ආයතන සුහද ක්‍රිකට් තරඟාවලිය ■ ගීත විචාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	02
04	විශේෂාංග සහ විශේෂ දින සැමරුම්	■ 2025 ජනවාරි මස 01 දින දානමය පිංකම හා සෙත්පිරිත් ■ පරිසර දිනය වෙනුවෙන් රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මකවීම ■ ලෝක ළමා දින සැමරුම් වැඩසටහන 2025 සිංහල අළුත් අවුරුදු සැමරුම් වැඩසටහන	

මූලාශ්‍රය : රිදියගම සෆාරි උද්‍යානය

වගු සටහන 2.27
2025.12.31 දිනට රිදියගම සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)	2025 සඳහා සත්‍ය වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	30.00	9.73	32%
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	172.27	141.103	82%
එකතුව	**202.27**	**150.83**	**75%**

මූලාශ්‍රය : රිදියගම සෆාරි උද්‍යානය

රිදියගම සෆාරි උද්‍යානය භෞතික ප්‍රගතිය

2025 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
විදුලි වැට අළුත්වැඩියා කිරීම	100%
සත්ව අරණ අලුත්වැඩියා කටයුතු	100%
ගේට්ටු සහ නල මාර්ග අලුත්වැඩියා කිරීම	70%
ආසියානු අලි කලාප අදියර II ප්‍රදේශය සහ චීටා කලාපය අතර චේන් ලින්ක් වැට (උස 16') - අඛණ්ඩ කටයුතු	85%
පාලම් තරාදිය සැපයීම සහ ස්ථාපනය කිරීම - ඉතිරි වැඩ	100%
පවතින ඉදිරිපස චේන් ලිනික් වැට සහ පිවිසුම් දොරටුව වැඩිදියුණු කිරීම	50%
ගොවි බිම් සංවර්ධනය	100%
උපස්ථ ජල සැපයුම	40%
නරඹන්නන්ගේ ප්‍රදේශය සහ නේවාසික ප්‍රදේශය අතර වැට සහ ආරක්ෂක කුටිය - ඉතිරි වැඩ	100%
මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය	100%

සත්වෝද්‍යාන සංවර්ධන හා සුබසාධන අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

ප්‍රධාන සංවර්ධන කාර්යයන්	භෞතික ප්‍රගතිය
රේසර් වයර් වැට - අදියර I	100%
කුඩා සත්තාරි උද්‍යානයේ විදේශීය පක්ෂි කුටියේ ඉතිරි කටයුතු	90%
කඩා වැටුණු මායිම් තාප්පය සඳහා නව මායිම් තාප්පයක් ඉදිකිරීම (හානියට පත් මායිම් වැට ප්‍රතිසංස්කරණය කිරීම)	100%
පශ්චාත් මරණ පරීක්ෂණ කාමරය	100%
අන්තර් සන්නිවේදන පද්ධතියේ ප්‍රතිසංස්කරණ කටයුතු	100%
රේසර් වයර් වැට - අදියර II	95%
5KVA උත්පාදක යන්ත්‍රයක් සැපයීම සහ ස්ථාපනය කිරීම	100%
සිංහ ගුහාව අංක 03 - ඉතිරි වැඩ	95%
දිවියා කලාපයේ ගේට්ටුව සහ වැටෙහි ඉතිරි වැඩ කටයුතු	70%
චීටා කලාපයේ ගුහා සහ අරණ	60%
කුඩා පරිමාණ අලුත්වැඩියා	100%



රූපය 2.11 - රේසර් වයර් වැට - අදියර I



රූපය 2.12 - පශ්චාත් මරණ පරීක්ෂණ කාමරය

2.2.6.5 දෙපාර්තමේන්තුවේ සත්ත්ව ආහාර නිෂ්පාදන ගොවිපල



දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ශාකභක්ෂක සතුන් සඳහා අවශ්‍ය නැවුම් සහ පෝෂණ ගුණයෙන් යුතු ආහාරවලින් කොටසක් සැපයීමේ අරමුණින් 1997 වර්ෂයේ දී හොරණ ගෝනපොළ ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තුළ "ගෝනපොළ ගොවිපල" ස්ථාපිත කරන ලදී. මේ වන විට හම්බන්තොට සෆාරි උද්‍යානය, පින්නවල අලි අනාථාගාරය හා පින්නවල සත්වෝද්‍යානය වෙත අවශ්‍යතාවය මත තණකොළ හා තැඹිලි වැනි ද්‍රව්‍ය සැපයීම සිදුකරනු ලබයි.

මීට අමතරව සත්ත්ව ආහාර ප්‍රවාහන වියදම අවම කර ගැනීම සහ පසු අස්වනු හානිය අවම කර ගැනීමෙන් අරමුණින්, කෑගල්ල දිස්ත්‍රික්කයේ දියගම පිහිටි අක්කර 16 ක භූමියක් තුළ "දියගම ගොවිපොළ" ස්ථාපිත කරන ලද අතර, එහි තවත් කොටසක් පිළියන්දල කහපොළ ප්‍රදේශයේ "කහපොළ ගොවිපලහි" ස්ථාපිත කර ඇත.

වගු සටහන 2.28
